





# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## මධ්‍යම පළාත

# කාර්යය සාධන වාර්තාව 2013




**"ගෙවන බද්ද මැද රටේ සංවර්ධනයටයි"**

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

දු.ක. 0812213022
ෆැක්ස් : 0812213033
ඊමේල් : info@revenuedept.cp.gov.lk
cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenuedept.cp.gov.lk

# පෙරවදන

## ආයතනයේ නීතිමය තත්වය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහතුන්වන සංශෝධනය මඟින් පළාත් සභාව නම් වූ පරිපාලන ඒකකය ආරම්භ වූ අතර, මෙම පළාත් සභාවන් හී ආදායම් කටයුතු සම්බන්ධ කාර්යභාරයන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 36 වන වගන්තිය යටතේ 36:1 සිට 36:20 දක්වා ඇති උප වගන්ති මගින් පළාත් සභාවන්ට අදාල වූ ආදායම් ප්‍රභවයන් හඳුන්වා දී ඇත.

ඉහත නෛතික විධිවිධානයන්ට අනුකූලව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්මත කර ගන්නට යෙදුණු 1990 අංක 17 දරණ මුදල් ප්‍රඥප්තියේ නෛතික රාමුව තුළ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

ඉහත කී මුදල් ප්‍රඥප්තිය මගින් හා 1996 අංක 03 දරණ මධ්‍යම පළාත් මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති මගින් පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ ඍජු පරිපාලනයට යටත්ව බදු හා ගාස්තු මෙන්ම පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතු බදු හා ගාස්තු වර්ග දක්වමින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විෂය පථය හදුන්වා දී ඇත. පහත සඳහන් ආදායම් ශීර්ෂ මෙම ප්‍රඥප්ති මගින් දක්වා ඇත.

- පිරිවැටුම් බද්ද
- මුද්දර ගාස්තුව
- ඔට්ටු බද්ද
- ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද
- මෝටර් ප්‍රවාහන පනත යටතේ ගාස්තු දණ්ඩන හා බලපත්‍ර ගාස්තු
- අධිකරණ දඩ හා ගාස්තු
- මධ්‍යම පළාත් ලොතරැයි පිළිබඳ බදු
- ඉඩම් හා ගොඩනැගිලි බද්ද
- ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් සඳහා ගාස්තු
- සුරාබදු ආදායම
- වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වූ ගාස්තු
- පඩි හා මිම් ආඥාපනත යටතේ ගාස්තු
- තෑගි තරග බද්ද

විධිමත් නෛතික ආවරණ අවශ්‍යතාවය හා ශ්‍රම බලකායේ සීමිතභාවය යන කාරණා මත පිරිවැටුම් බද්ද, මුද්දර බදු ගාස්තුව, ඔට්ටු බද්ද යන බදු වර්ගයන් කෙරෙහි මූලික අවධානය යොමු කරමින් අප දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙමින් පවතී.

## කාර්යයන් හා වගකීම්

කාර්යක්ෂම සාමානාත්මක හා යුක්ති සහගත බදු පරිපාලන ක්‍රමයක් ස්ථාපිත කර මධයම පළාතේ ජනතා අභිවෘද්ධිය සඳහා අවශ්‍ය මූල්‍යමය සම්පත් නියමිත ඉලක්ක අභිබවමින් නීතියට එකඟව බදු හා ගාස්තු වශයෙන් රැස් කිරීම හා ඊට අදාළව විධිමත් ප්‍රතිපත්තියක් කාලීන අවශ්‍යතා මත කාර්යක්ෂමව පවත්වා ගෙන යාම.

**තත්ත්ව විශ්ලේෂණය**

මධ්‍යම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 2011 අයවැය යෝජනා මගින් පිරිවැටුම් බද්ද අත්හිටුවීම නිසා පළාත් අදායම් දෙපාර්තමේන්තුවේ පැවති ප්‍රධානම ආදායම් ප්‍රභවය අහිමි විය. පිරිවැටුම් බදු ආදායම් දෙපාර්තමේන්තුවේ මුළු ආදායමෙන් 77% ක් පමණ විය. කෙසේ වුවද වර්තමානයේ පිරිවැටුම් බදු ලෙස 2010-12-31 දක්වා වන හිඟ හිටි බදු පමණක් අයකර ගැනීම සිදුවේ.

පිරිවැටුම් බද්ද අත්හිටුවීමත් සමගම අප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය බවට පත්වන්නේ මුද්දර ගාස්තුයි. ඊට අමතරව ඔට්ටු බද්ද අයකිරීම සිදුවේ. මුද්දර ගාස්තු හැරුණු විට අනෙකුත් ප්‍රභවයන්ගේ ආදායම් මට්ටම පහළ අගයක් ගනි.

මෙවැනි තත්ත්වයක් තුළ පවතින ආදායම් ප්‍රභවයන්ගේ ආදායම් ලබාගැනීමේ ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම හා ඵලදායි මට්ටමකින් පවත්වා ගැනීමත් නව ආදායම් ප්‍රභවයන් සොයා ගැනිමත් වර්තමානයේ අභියෝගයක්ව පවති. රජයේ බදු අය කිරිමේ නව දැක්ම අනුව සෑම විටම අවම පීඩනයක් සාමාන්‍ය මහජනතාව වෙත පැවරීම ප්‍රතිපත්තියක් වී ඇත. ඒ අනුව නව ආදායම් ප්‍රභවයන් අනුමත කර ක්‍රියාත්මක කිරිම වර්තමානයේ පෙරට වඩා අභියෝගයක් බවට පත්ව ඇත. එමෙන්ම,

- ❖ ජනප්‍රිය පාසල් සහ යටිතල පහසුකම් පැතිරීමේ ඇති දැඩි විෂමතාවය නිසා පහසුකම් සහිත ප්‍රදේශවලින් දුරස් වන විට දේපලවල මිල ගණන්වල විශාල වෙනසක් තිබීම හා පහසුකම් සහිත ප්‍රදේශවල දේපල හුවමාරු වීම අඩුවෙමින් පැවතීම
- ❖ පළාතේ ඉඩම්වලින් බහුතරය කෘෂිකාර්මික හා වතු ඉඩම් සහ රක්ෂිත භූමි වීම නිසා කැබලි කර විකිණීම අඩු වීම
- ❖ දේපලවල මිල ඉහළ යාමට තුඩු දෙන මහා පරිමාණ හෝ මධ්‍යම පරිමාණ ව්‍යාපෘති මධ්‍යම පළාත තුළ බහුල නොවීම
- ❖ නාගරීකරණය වීමේ අඩු වේගය යන හේතු නිසා දෙපාර්තමේන්තු ප්‍රධානතම ආදායම් මුලාශ්‍රය වන දේපල හුවමාරු අගය මත අය කරන මුද්දර ගාස්තු ආදායම් ඉහළ නංවා ගැනීම අභියෝගයක්ව පවතී.

දෙපාර්තමේන්තුවේ තුන්වන පරමාර්ථය වන වාර්ෂික ආදායම් වර්ධන වේගය 10% කට වැඩියෙන් පවත්වාගෙන යාමට නම් දැනට දෙපාර්මේන්තුව විසින් යෝජිත නව ආදායම් ප්‍රභවයන් ක්‍රියාත්මක කළ යුතුව ඇත.

මධ්‍යම පළාත් සභාවේ ඵලදායිතාවය නංවාලීමේ අරමුණින් 2012 වසරේදී සකස් කෙරුණු උපායශීලි සැලසුමට අදාළ පළාතේ එක් දෙපාර්තමේන්තුවක් ලෙස පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ද ක්‍රියාකාරි දායකත්වය සැපයීමේ අරමුණ පෙරදැරි කරගෙන එම උපායශීලි සැලසුමේම කොටසක් ලෙස අප දෙපාර්තමේන්තුවේ 2013 අදාල අරමුණු හා උපායයන් සකස් කෙරිණ.

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත)

**දැක්ම**

මධ්‍යම පළාතේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක්

**මෙහෙවර**

ව්‍යවස්ථාපිත ආදායම් මූලාශ්‍ර තුලින් ආදායම් රැස්කිරීමත්, බදු හා ගාස්තු ගෙවිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත්, ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන්, සමානාත්මතාවයෙන් හා සාධාරණව කටයුතු කිරීමෙන්, මධ්‍යම පළාතේ ආදායම වැඩි දියුණු කිරීම මගින් පළාත්වාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

**වටිනාකම** පරිපූර්ණත්වය

1. වෘත්තීය දක්ෂකම
2. කැපවීම
3. සහයෝගීත්වය

**පරමාර්ථ / අරමුණු**

1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම
2. නව ආදායම් උත්පාදන මූලාශ්‍ර පිළබඳ පර්යේෂණ හා සංවර්ධනය
3. වෘත්තීය නිපුණතාවය වැඩි දියුණු කිරීම
4. යහපාලනය

**ආදායම් ඉලක්කය 2013 වර්ෂය**

| ආදායම් ප්‍රභවය | | ඉලක්කය රුපියල් |
|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 850,000,000 |
| 02 | හිග පිරිවැටුම් බදු | 15,000,000 |
| 03 | නව ආදායම් උත්පාදන ක්‍රමෝපායන් | 25,000,000 |
| 04 | ඔට්ටු බද්ද | 300,000 |
| | එකතුව | **893,000,000** |

**2013 වර්ෂයේදී අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය**

| ආදායම් ප්‍රභවය | | ඉලක්කය රුපියල් | තත්‍ය ආදායම රුපියල් | ළඟා වීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 850,000,000 | 862,749,671 | **101%** |
| 02 | හිග පිරිවැටුම් බදු | 15,000,000 | 16,083,077 | **107%** |
| 03 | නව ආදායම් උත්පාදන ක්‍රමෝපායන් | 25,000,000 | අනුමත වී නැත | |
| 04 | ඔට්ටු බද්ද | 300,000 | 231,028 | 77% |
| | එකතුව | **890,300,000** | **878,063,776** | |

**1. 2013 වර්ෂයේදී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 850 ක් එකතු කිරීම**

වර්තමානයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය මුද්දර ගාස්තු ආදායම වන බැවින් ඉහත අරමුණ වෙත ලගා වීමට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුල සිටම මනා සැලැස්මක් ඇතිව කටයුතු කල අතර, දෙපාර්තමේන්තුවේ වැඩ බෙදාහැරීමේදී මුද්දර අංශය වෙත වැඩි අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් එක්අයකු (1), තක්සේරුකරුවන් දස (10) දෙනෙකු, බදු නිලධාරීන් අට(8) දෙනෙකු සංවර්ධන සහකාර නිලධාරීන් හයදෙනෙකු (6) ද එම අංශය වෙත අනුයුක්ත කරන ලදි. ඒ අනුව ඒ අනුව පෙර වර්ෂයට වඩා රුපියල් **ලක්ෂ 350** වර්ධනයක් කරා ළඟා කර ගනිමින් ඉලක්ක කල මුද්දර ආදායම ඉක්මවා යෑමට දෙපාර්තමේන්තුවට හැකි විය.


2012 වර්ෂයේ අගභාගයේ සිට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලබාගන්නා තොරතුරු පරිගණකගත වැඩසටහනක් මඟින් තාවකාලික ගොනු අංකයක් යටතේ සටහන් කර ඒ මගින් වැඩිමනක් තොරතුරු කැඳවා එම තොරතුරු විශ්ලේෂණය කර වැඩිදුර කටයුතු අවශ්‍ය නම් පමණක් මුද්දර ගාස්තු ගොනු විවෘත කරනු ලබු නිසා, 2013 වසරේදී වැඩි ඵලදියිතාවයෙන් යුතු ගොනු විවෘත කිරීමට හැකි විය. එමෙන්ම 2013-01-01 දින සිට ක්‍රියාත්මක වු නිශ්චල දේපල පැවරීමේ දී ලියනු ලබන සියළුම සාධන පත්‍ර සඳහා පළාත් මුද්දර වෙනුවට මුද්දර වටිනාකමට සමාන බැංකු රිසිට්පත් ඇලවීම නියම කිරීමත් සමගඑම රිසිට්පත් සමඟ දේපල දීමනාකරු හා ලැබුම්කරු පිළිබඳ තොරතුරු පතක් නිකුත් කරන ලදි. එමගින් තොරතුරු ලබා ගැනීම කඩිනම් විය.

ඔප්පු ලිවීමේදී නියමිත වටිනාකම් ඇතුළත් කර නිවැරදි මුද්දර ගාස්තු ගෙවීමට මහජනයා දැනුවත් කිරීමට නොතාරිස්වරුන් පෙළඹවීම සඳහා මධ්‍යම පළාත් මුදල් ප්‍රඥප්තියේ 67 වගන්තිය කෙරෙහි අවධානය යොමු කර නොතාරිස්වරුන් වෙත දැන්වීම් නිකුත් කිරීමට ද කටයුතු කරන ලදි. තවද,දෙපාර්තමේන්තුවේ ආදායම් වැඩි කර ගැනීමටත්, නොදැනුවත්කම මත සාධන පත්‍ර අඩු තක්සේරුවට ලියා පසුව දණ්ඩනද සමග අතිරේක මුද්දර ගාස්තු ගෙවීමට සිදුවීමෙන් මහජනතාව පත් වන අපහසුතාවය වළක්වා ගනු පිණිසත්, පිළියමක් ලෙස, දේපලක් හුවමාරුවීමට ප්‍රථම දෙපාර්තමේන්තුව වෙත පැමිණ අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කළ විට ගෙවිය යුතු මුද්දර ගාස්තු පිළිබඳ තක්සේරුකැගේ මතය ලබාදීමේ නව ක්‍රියා පිළිවෙළක් 2013-05-01 දින සිට ආරම්භ කරන ලදි. මේ වන විට එම වැඩපිළිවෙළ ඉතා සාර්ථකව ක්‍රියාත්මක වනු අතර, මේ නිසාවෙන් ඌන මුද්දර ගාස්තු සඳහා තක්සේරු දැන්වීම් නිකුත් කිරීම අඩු වූ අතර,ප්‍රභවයේදීම නියමිත බද්ද අයකර ගැනීමට හැකි විය.

2012 වසරේ ආදායම තුල අතිරේක මුද්දර ගාස්තු ලෙස අයකල රු 53,011,739 ක් ඇතුලත් වන අතර 2013 වසරේ රැස් කරන ලද අතිරේක මුද්දර ගාස්තු ආදායම රු:71,011,329 කි එය පෙර වර්ෂයට සාපේක්ෂව 34% ක වර්ධනයකි. එයට හේතු වූයේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුළුල් දැක්මක් අනුව කටයුතු කිරීම බව කිවයුතුයි. එමෙන්ම මාණ්ඩලික නිලධාරීන්ට ආදායම් ඉලක්ක ලබා දුන් අතර ඔවුන්ගේ එම ආදායම් ඉලක්ක වෙත ලගා වීමේ ප්‍රගතිය මාසික වාර්තාවක් සේ ප්‍රධාන ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

| මුද්දර ගාස්තු ආදායම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ආදායම රු. | වර්ධනය % |
| 2007 | 420,000,000 | 425,379,136 | |
| 2008 | 659,000,000 | 417,795,728 | -2 |
| 2009 | 907,000,000 | 374,752,586 | -10 |
| 2010 | 440,000,000 | 481,400,739 | 28 |
| 2011 | 368,000,000 | 684,335,872 | 42 |
| 2012 | 725,000,000 | 827,681,905 | 21 |
| **2013** | **850,000,000** | **862,749,671** | **4** |

| අතිරේක මුද්දර ගාස්තු ආදායම | |
|---|---|
| වර්ෂය | ආදායම රු. |
| 2008 | 1,884,361 |
| 2009 | 2,592,691 |
| 2010 | 838,308 |
| 2011 | 16,527,044 |
| 2012 | 53,011,739 |
| **2013** | **71,011,329** |




**2. පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 15ක් එකතු කිරීම**

පිරිවැටුම් බද්ද අහෝසි වීමත් සමඟ 2011 වර්ෂයට පෙර වර්ෂයන් සඳහා ගෙවිය යුතු හිඟව පවතින බදු ගෙවීමට බදු ගෙවන්නන්ගේ අනුකූලතාව ඉතා අඩු වූ අතර, එම බදු අයකර ගැනීමට ප්‍රඥප්තිය ප්‍රකාරව ගතහැකිව තිබූ සියළු ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව 2013 වර්ෂයේදී රු.16,083,077 ක මුදලක් එකතු කරන ලද අතර ඒ වෙනුවෙන් ගොනු කරන ලද නව නීතිමය පියවර ගැනිම 67 ක්ද, ස්ථානයට ගොස් කරන ලද දැනුවත් කිරීම් 198 ක් ද විය.

**3. නව ආදායම් උත්පාදන ක්‍රමෝපායන් මගින් රුපියල් මිලියන 25 ක් එකතු කිරීම**

පහත සඳහන් යෝජනා, මේ වන විට ඉදිරිපත් කර ඇති අතර, මෙතෙක් අනුමත වී නොමැති හෙයින් මෙම ඉලක්කය ඉටු කර ගැනීමට නොහැකි විය.

1. බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය
2. ඛනිජ බදු ප්‍රඥප්තිය
3. ඖෂධ හා රසායන වෙළඳ බලපත්‍ර බදු ප්‍රඥප්තිය
4. මෝටර් රථවාහනයක අයිතිය පැවරීමේ මුද්දර ගාස්තුව

ඉහත සඳහන් සිය අරමුණු ළඟා කර ගැනීම සඳහා පහත පරිදි ක්‍රියාකාරි සැලැස්මක් 2013 වර්ෂයේදී පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවන ලදී.

| අරමුණ | අංශය | කාර්යයන් | ඉලක්කය | ඉටු කිරීම |
|---|---|---|---|---|
| 1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම | මුද්දර අංශය | 1. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලැබෙන තොරතුරු අංශ අනුව බෙදාහැරීම<br>2. අදාල කාර්යාලවලට ගොස් තොරතුරු රැස්කිරීම<br>3. මෙම ලබාගත් තොරතුරු අදාල අංශ අනුව බෙදා හැරීම | 25000 | 25707 |
| | | 4. තොරතුරු ලේඛනයට අනුව ගොනු ආරම්භ කිරීම | 6500 | 17999 |
| | | 5. ගොනු සඳහා සාධන පත්‍ර කැඳවීම. | 6500 | 17999 |
| | | 6. ගොනු විශ්ලේෂණය කිරීම. | | 46536 |
| | | 7. සාධන පත්‍ර නොලැබුණු ගොනු හඳුනා ගැනීම. | | ඉටු කර ඇත |
| | | 8. i. ගෙවූ ගාස්තු ප්‍රමාණවත් නම් ගොනුව අවලංගු කිරීම. | | 7010 |
| | | ii. ගෙවීම් ප්‍රමාණාත්මක නොවන්නේ නම් සම්මුඛ සාකච්ඡා කැඳවා අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම හෝ එකතු නොවනවිට ස්ථාන පරීක්ෂණ සිදුකර හෝ අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම | රු.මිලි.55 | රු.මිලි.71 |
| | | 9. තක්සේරු දැන්වීම් නිකුත් කිරීම. | 1000 | 1322 |
| | | 10. අභියාචනා /විරෝධතා විසඳීම.(ලැබෙන සියල්ල) | | ඉටු කර ඇත |
| | | 11. තක්සේරු දැන්වීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | | |
| | තක්සේරු අංශය පිරිවැටුම් බදු | 1. පිරිවැටුම් බදු වාර්තා සපයා බදු ගෙවා නොමැති හෝ වාර්තා සපයා නොමැති කාර්තු සඳහා තක්සේරු දැන්වීම් හෝ අතිරේක තක්සේරු නිකුත් කිරීම | 100 | 226 |
| | | 2. පිරිවැටුම් බදු වාර්තා පරීක්ෂා කර ස්වතක්/නිදහස් ලකුණු කිරීම | 5000 | 54673 |
| | | 3. ලිපිගොනු ආවේක්ෂණය කිරීම | 3000 | 9807 |

| | | | | |
|---|---|---|---|---|
| | | 4. ලිපිගොනු විගණනය කිරීම | 100 | 110 |
| | | 5. අක්‍රිය ලිපිගොනුවල කටයුතු නිම කර ගොනු සංඛ්‍යාව අඩු කිරීම | 1000 | 418 |
| | | 6. 2010-12-31 දක්වා පිරිවැටුම් බදු ලිපිගොනුවල කටයුතු නිම කර ගොනු අවසන් කිරීම | 2000 | 3751 |
| | අය හා හිඟ බදු අංශය | 1. හිඟ පිරිවැටුම් බදු අය කිරීම | රු.මිලි. 15 | රු.මිලි. 16 |
| | | 2. අභියාචනා /විරෝධතා විසඳීම<br>ඉදිරිපත් කර ඇති සියලුම අභියාචනා විසඳා අවසන් කිරීම | සියල්ලම | ඉටු කර ඇත |
| | | 3. පැහැර හැරි තැනැත්තන්ගේ ස්ථානවලට ගොස් හිඟ බදු එකතු කිරීම (D 7) | 250 | 198 |
| | | 4. නොගෙවූ හා එකඟතාවයකට නොපැමිණෙන අය වෙනුවෙන් නීතිමය පියවර ගැනීම. | 40 | 67 |
| | | 5. ගෙවීම් පත්වල දත්ත පරිගණක ගත කිරීම | සියල්ලම | ඉටු කර ඇත |
| | | 6.අගරු චෙක්පත් පිළිබඳව ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීම | | ඉටු කර ඇත |
| | 2. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම. | 1. නීති අධ්‍යයනය කිරීම හා පවතින ප්‍රභවයන් මොනවාදැයි අධ්‍යයනය කිරීම. | | අනුමැතියට ඉදිරිපත් කර ඇත |
| | | 2. එම ප්‍රභවයන් පිළිබඳ සබ්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම. | | |
| | | 3. එම එක් එක් ආදායම් ප්‍රභවයන්ගෙන් උපයාගත හැකි ආදායම හඳුනා ගැනීම | | |
| | | 4. ක්‍රියාත්මක කිරිමට වඩා සුදුසු ආදායම් ප්‍රභවයන් තීරණය කිරීම. | | |
| | | 5. හඳුනාගත් නව ආදායම් උත්පාදන ක්‍රම යෝජනාවලිය ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම | | |
| 3. සියයට දහයට (10 %) වැඩි වාර්ෂික ආදායම් වර්ධන අනුපාතයක් පවත්වාගෙන යාම | කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | 1. වෘත්තීය පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම | | ඉටු කර ඇත |
| | | 2. පාඨමාලා ක්‍රමවේදයක් සකස් කිරීම. | | |
| | | 3. සම්පත්දායක පුද්ගලයන් සහ ආයතන හඳුනා ගැනීම. | | |
| | | 4.පිරිවැය හඳුනා ගැනීම. | | |

| | | | | |
|---|---|---|---|---|
| | තෙවන පාර්ශ්වයන් දැනුවත් කිරීම | 1. අදාළ ස්ථානවල ප්‍රදර්ශනය සඳහා දැන්වීමක් සකස් කිරීම හා ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම<br>2. පුවත්පත් දැන්වීම් එළ කිරීම<br>3. දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම<br>4.වෙබ් අඩවියක් සැකසීම | } | ඉටු කර ඇත |
| යහපාලනය | | 1. ආයතනයේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම<br>2. රාජ්‍ය නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම<br>3. පැමිණිලිවලින් තොර වූ ආයතනයක් ඇති කිරීම | } | කටයුතු කර ඇත |

ඉහත සියලුම දත්තයන් ලබා ගන්නා ලද්දේ නිලධාරීන්ගේ දෛනික, මාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ල පරීක්ෂා කිරීමෙනි.

මීට අමතරව අපගේ ප්‍රගතිය වර්ධනය කර ගැනීම සඳහා මහජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, ඉඩම් රේජිස්ටාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ තක්සේරුදෙපාර්තමේන්තුව, මහජන බැංකුව, ලංකා බැංකුව හා පොලිසිය, අධිකරණ සහ වෙනත් රජයේ ආයතන මෙන්ම ගරු ආණ්ඩුකාරතුමා,ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ප්‍රධාන ලේකම්තුමා ඇතළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගයද කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමි.

2013 වසරේ දී මෙන්ම 2014 වර්ෂයේ දී ද අපගේ ක්‍රියාකාරි සැලැස්ම තුළින් ඉදිරිපත් කරනු ලබන ඉලක්ක අභිබවා යමින් මධ්‍යම පළාත් සභාවේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක් ලබා දීමට අපි ඇප කැප වෙමු.

**ස්තූතියි,**

(එච්. කේ. අජන්තා පෙරේරා)

පළාත් ආදායම් කොමසාරිස්

මධ්‍යම පළාත